# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2262/38 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/6/2020/එච්ඩබ්/236.
මගේ අංකය : 22/2021.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 351, බෙලිඅත්ත නගරය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බෙලිඅත්ත නගරය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 830137 හා 2021.11.30 දිනැති සැලැස්මේ කැබලි අංක 139 ලෙස පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0328 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස:

01. **කැබලි අංක 139**

ඉඩමේ නම: හත්බෝධියවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, පොල්ගස් 03 ක් සහ කෙසෙල් ගස් සහිත මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විජේසේකර පතිරණගේ ප්‍රදීප් ජයශාන්ත (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0328.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2022.02.07 දින, පූ.භා. 10.00ට බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ වියයුතුයි.

තවද, 2022.01.31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් හා
අත්කර ගැනීමේ නිලධාරී,
බෙලිඅත්ත.

2021 දෙසැම්බර් 16 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
බෙලිඅත්ත.

EOG 1 - 0138


1A - G 35817 - 12 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*